
කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව
ISSN-2706-0047
2025 ජනවාරි - අප්‍රේල්
9 වන වෙළුම 1 වන කලාපය

# ශ්‍රී ලංකාවේ තැපැල් ඡන්ද ක්‍රියාවලිය

චන්න පී. ද සිල්වා, අධ්‍යක්ෂ (පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
මැතිවරණ කොමිෂන් සභාව




## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව 1815 දී මුළුමනින්ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති අතර, එයට පෙර මෙරට පැවතියේ කුල වැඩවසම් ක්‍රමයකි. මෙම කුල වැඩවසම් වාදය වෙනුවට ධනවාදය ගොඩ නැගීම උදෙසා 1829 කෝල්බෲක් කැමරන් යෝජනා සාර්ථක වූ බව ප්‍රකාශ වී ඇතිමුත්, ඒ සම්බන්ධව ප්‍රතිවිරෝධතා ද වරින් වර ප්‍රකාශ වී තිබේ. මැතිවරණයෙන් තෝරා පත්කරගත් පාර්ලිමේන්තුව මගින් බ්‍රිතාන්‍ය පාලනය ක්‍රියාත්මක වූ අතර, එකී පාලන ක්‍රමය මෙරට ස්ථාපිත කිරීමට ද ඔවුහු උත්සුක වී ඇත. 1910 දී කෲව්-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ, 1920 හා 1924 දී මැනිං-ඩෙවොන්ෂයර් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හා 1944 දී සෝල්බරි කොමිෂන් සභා යෝජනා අනුව ශ්‍රී ලංකාවට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයට යෝජනා ඉදිරිපත් කොට තිබේ. 1931 මෙරටට සර්වජන ඡන්ද බලය ලැබෙන්නේ රට තුළ වූ අභ්‍යන්තරික පෙළඹවීමකින් නොව, බ්‍රිතාන්‍යය ප්‍රමුඛ යුරෝපයේ ඇති වූ විශේෂ තත්ත්වයන් පිළිබඳ සංවේදී වූ ඩොනමෝර් කොමසාරිස්වරුන්ගේ උත්සුක වීමෙනි. ඩොනමෝර් කොමිසමේ යෝජනා අනුව ප්‍රදානය වූ සර්වජන ඡන්ද බලය එදා තත්ත්වයෙන් පමණක් නොව අදට ද, හෙටට ද වැදගත් වන ඓතිහාසික සංසිද්ධියකි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය ජනතාව කෙරෙහි පිහිටා ඇති අතර, පරමාධිපත්‍ය අත්හළ නොහැකි යැයි ද දක්වා ඇත. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය ද ඇතුළත් වේ. එසේම එහි හතර (අ) ව්‍යවස්ථාව පරිදි ජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක වීම හා භුක්ති විඳීම දක්වා ඇති අතර, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරාපත් කරගනු ලබන මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් ද ජනමත විචාරණයක දී ජනතාව විසින් ද ක්‍රියාත්මක කළ යුතු යැයි දක්වා ඇත. ඒ අනුව රටේ පාලනය සඳහා පිළිගත් නීතියක් යටතේ ජනතාවගේ මනාපය පරිදි මහජන නියෝජිතයින් තෝරාපත් කරගැනීම සඳහා මැතිවරණ ක්‍රම යොදා ගනී. ලංකාවේ විධායකය, ව්‍යවස්ථාදායකය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා මහජන නියෝජිතයින් තෝරාපත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම් පවත්වනු ලැබේ. මේ සඳහා අවැසි නීතිමය රාමුව සැකසී ඇත්තේ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා මැතිවරණ අණ පනත්වල පවත්නා විධිවිධාන අනුව වේ.

## 2. මැතිවරණ දෙපාර්තමේන්තුව සහ මැතිවරණ කොමිෂන් සභාව

1931 වර්ෂයේ දී සර්වජන ඡන්ද බලය හිමි වුව ද 1947 වර්ෂය වනතුරු ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා ඊට වෙන් වූ ආයතනයක් නොපැවතිණ. මේ නිසා එම වගකීම ඒ ඒ අවස්ථාවල පැවති කිසියම් රාජ්‍ය ආයතනයකට භාරදෙනු ලැබිණ. මේ සඳහා කොමසාරිස්වරයෙකු හා සහකාර කොමසාරිස්වරයෙකු පත්කරන ලද අතර, දිස්ත්‍රික් මට්ටමේ දී ඡන්ද විමසීම් සංවිධානය හා පැවැත්වීම ආණ්ඩුවේ ඒජන්තවරුන්ට පැවරිණ.

1946 සිට 1955 දක්වා ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා දෙපාර්තමේන්තු දෙකක් පැවතිණ. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුවට ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමටත්, පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමටත් බලය පැවරුණු අතර, පළාත් පාලන ඡන්ද විමසීම් පැවැත්වීමේ බලය පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුවට පැවරිණ. මෙම දෙපාර්තමේන්තු ඒකාබද්ධ කොට 1955 ඔක්තෝබර් 01 දින මැතිවරණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

මැතිවරණ දෙපාර්තමේන්තුවේ වගකීම වූයේ නිදහස් හා සාධාරණ මැතිවරණ පවත්වමින් පුරවැසියන්ගේ සර්වජන ඡන්ද බලය සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමත්, වාර්ෂිකව සුදුසුකම්ලත් ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමත්, නුසුදුසු පුද්ගලයන් ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් වීම වැළැක්වීමත් සහ දේශපාලන පක්ෂ පිළිගැනීමත්ය. මැතිවරණ දෙපාර්තමේන්තුව කිසිදු අමාත්‍යාංශයක් යටතට පත්නොකරන ලද රාජ්‍ය ආයතනයක් විය. නොයෙකුත් දේශපාලන පක්ෂ හා සිවිල් සමාජ සංවිධාන විසින් වර්ෂ 2000 පමණ සිට ඡන්ද විමසීම් වඩාත් ස්වාධීන ලෙස පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවක් පිහිටුවීමේ අවශ්‍යතාව පිළිබඳව කරනු ලැබූ ඉල්ලීම් මත 2015 දී මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 අ වගන්තිය පරිදි මැතිවරණ කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු වන අතර ඉහත වගකීම්වලට පමණක් සීමා නොවන බවට ද දක්වා ඇත.

## 3. තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීම

යම් මැතිවරණයක දී හෝ ඡන්ද විමසීමක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලැබීමට ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටිය යුතු වේ. ඒ අනුව ඡන්ද හිමියන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි සියළු ඡන්ද හිමියන්ට ඕනෑම ඡන්ද විමසීමක දී පෞද්ගලිකව ඡන්ද

පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමට අවකාශය හිමි වේ. එසේ වුව ද තමාගේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි කොට්ඨාසයෙන් බැහැර ස්ථානයක ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදා ගනු ලබන නිලධාරීන්ට ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වේ. ඡන්ද විමසීම් රාජකාරි සඳහා ස්ථිරවම යොදා ගන්නා රාජ්‍ය නිලධාරීන් හා ඡන්ද විමසීම් හා සබැඳි අත්‍යාවශ්‍ය රාජකාරීවල නියැලෙන ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන්ට දීප ව්‍යාප්ත ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වීම වළක්වාලීම සඳහා එවැනි තෝරාගත් ආයතනවල නිලධාරීන්ට පමණක් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අවශ්‍ය නීති රීති සම්පාදනය කොට ඒවා අදාළ ඡන්ද විමසීම් පනත්වලට ඇතුළත් කොට ඇත.

## 4. තැපැල් ඡන්ද ක්‍රියාවලියේ ආරම්භය

1931 සිට පැවති මැතිවරණවල දී පෞද්ගලිකව ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීම හා තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම පළමු වරට හඳුන්වා දෙන ලද්දේ 1959 අංක 11 දරන ලංකා පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතිනි. ඒ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) ආඥා පනතට පස්වන උපලේඛනය ලෙස 1959 තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ නියෝග මාලාව ඉහත සඳහන් සංශෝධන පනතින් හඳුන්වා දීමත් සමඟිනි. එමගින් රාජ්‍ය සේවකයන්ට, පළාත් පාලන සේවයේ සේවකයන්ට, පොලිස් නිලධාරීන්ට, ආරක්ෂක අංශවල සාමාජිකයන්ට, දුම්රිය හා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ට තැපෑලෙන් ඡන්දය දීමේ වරම හිමි විය. එයට පෙර පැවතියේ මැතිවරණ කොට්ඨාසයක ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි රජයේ සේවකයකුට එම මැතිවරණ කොට්ඨාසයේම ඡන්ද පොළක මැතිවරණ රාජකාරි සඳහා පත් කළහොත්, ඔහුගේ ලියාපදිංචි විස්තර ද ඇතුළත් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් නිකුත් කරන සහතිකයක් තමා සේවය කරනු ලබන ඡන්ද පොළේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ඉදිරිපත් කොට එහිදී නිකුත් කෙරෙන ඡන්ද පත්‍රිකාවක් භාවිත කොට එම ඡන්ද පොළේ දී ඡන්දය පාවිච්චි කිරීමට ඉඩ ලැබුණි. මෙම සංශෝධන පනත අනුව ශ්‍රී ලංකාවේ තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රමය පළමු වරට ක්‍රියාවට නංවන ලද්දේ 1960 මාර්තු මස 19 දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ය. මෙම මැතිවරණයට පෙර පැවති ඡන්ද විමසීම් දින කිහිපයක් තිස්සේ පැවැත්වුණි. එබැවින් ඒ මැතිවරණ සඳහා සීමිත නිලධාරීන් පිරිසක් යෙදවීම හේතුවෙන් මෙවැනි ක්‍රමවේදයක අවශ්‍යතාව පැන නොනැගුණි. එසේ වුවද එක් දින ඡන්ද විමසීම ආරම්භ වීමත් සමඟ ඡන්ද විමසීමේ දිනයේ රාජකාරි සඳහා විශාල රජයේ සේවකයන් හා පොලිස්/හමුදා නිලධාරීන් සංඛ්‍යාවක් සේවයේ යොදවා ගැනීම හේතුකොටගෙන තැපැලෙන් ඡන්දය ප්‍රකාශය කිරීමට පහසුකම් සැලසීමට නීති සම්පාදනය කිරීමට සිදුවිය.

## 5. මැතිවරණ/ ඡන්ද විමසීම් පනත්වල තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අදාළ වගන්ති

| පනත | වගන්ති හා නියෝග අංක |
|---|---|
| **1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත** | • 26 (1) සිට (12) දක්වා වූ වගන්ති<br>• 26 (2) වගන්තිය<br>• මෙම පනතේ දෙවන උපලේඛනයේ සඳහන් 1981 තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග 1 සිට 28 දක්වා වූ වගන්ති හා එම නියෝග |
| **1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත** | • 9 (1) වගන්තිය<br>• 9 (2) වගන්තිය<br>• මෙම පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් 1981 තැපැල් ඡන්දදායකයන් (ජනමතවිචාරණ) පිළිබඳ නියෝග 1 සිට 28 දක්වා වූ වගන්ති හා එම නියෝග |
| **1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත** | • 23 (1) සිට (12) දක්වා වූ වගන්ති<br>• 23 (2) වගන්තිය<br>• මෙම පනතේ දෙවන උපලේඛනයේ 1981 තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග සඳහන් 1 සිට 28 දක්වා වූ වගන්ති හා එම නියෝග |
| **1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත** | • 24 (1) වගන්තිය<br>• 24 (2) වගන්තිය<br>• මෙම පනතේ දෙවන උපලේඛනයේ සඳහන් 1988 තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ (පළාත් සභා ඡන්ද විමසීම්) නියෝග 1 සිට 28 දක්වා වූ වගන්ති හා එම නියෝග |
| **පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (සංශෝධිත) (262 වන අධිකාරය)** | • 39 ආ (1) සිට (12) දක්වා වූ වගන්ති<br>• 39 ආ (2) වගන්තිය<br>• මෙම පනතේ නවවන උපලේඛනයේ සඳහන් 1987 (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග 1 සිට 28 දක්වා වූ වගන්ති හා එම නියෝග |

## 6. තැපෑලෙන් ඡන්දය දීමේ හිමිකම හා එම විධාන කඩ කිරීමේ වරද

ඉහත සඳහන් පරිදි සෑම මැතිවරණ/ ඡන්ද විමසීම් පනත්වල, එනම් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26 (1), ජනමතවිචාරණ පනතේ 9 (1), ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 23 (1), පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 24 (1), පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 39 ආ (1) වගන්තිය අනුව තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා තැපැල් ඡන්ද දායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු විසින් තැපෑලෙන් ඡන්දය දිය හැකි අතර, ඒ තෝරා පත්කර ගැනීමේ දී පෞද්ගලිකව ඡන්දය නොදිය යුතු යැයි ද;

එයට අමතරව ඉහත උප වගන්තියේ සඳහන් විධිවිධාන කඩකරමින් තෝරා පත්කර ගැනීමක දී පෞද්ගලිකව ගොස් ඡන්දය දෙන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හෝ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු යැයි ද දක්වා ඇත.

## 7. තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් ව්‍යාප්ත කිරීම

එසේම පසුකාලීනව, මෙම පනත්වලින් ආවරණය නොවන එහෙත්; මහජනතාවගේ දෛනික ක්‍රියාවන් හා රටේ සාමාන්‍ය පරිපාලන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධා ඇති නොවන පරිදි හා අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යෑම් වස් ඒ සඳහා සෘජුවම සම්බන්ධ වන යම් යම් රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයන්ට ද තැපැල් ඡන්ද පහසුකම් ලබාදෙන ලෙස බොහෝ ඉල්ලීම් ලැබී තිබේ. එබැවින් ඡන්ද විමසීම් දිනයේ දී අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා එකී අත්‍යාවශ්‍ය රාජකාරීවල නියැලෙන හා එදිනට සේවා මුර සඳහා යොදවා ගනු ලබන සේවකයන් වෙත, මැතිවරණ දෙපාර්තමේන්තුව හා මැතිවරණ කොමිෂන් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ පරිදි තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසා දී තිබිණ. ඒ අනුව

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මහවැලි ආරක්ෂක බලකාය මගින් පැය 24 පුරා ආවරණය වන සේ ආරක්ෂාව සපයනු ලබන වික්ටෝරියා ජලාශය, පොල්ගොල්ල ජලාශය, රන්දෙණිගල ජලාශය, කොත්මලේ ජලාශය, කළා වැව, උඩවලව ජලාශය, බෝවතැන්න ජලාශය, මාදුරුඔය ජලාශය, උල්හිටිය/ රත්කිඳ

ජලාශය, කළුගඟ ජලාශය, දඹුලුඔය, කණ්ඩලම, මොරගහකන්ද ජලාශය, බදුළුඔය ජල පැන්නුම යන ජලාශ/ වේලි හා ස්ථානවල රාජකාරි සඳහා යොදවනු ලබන සේවකයින් ;

- ලංකා විදුලිබල මණ්ඩලය විසින් පැය 24 පුරා අඛණ්ඩව පවත්වාගෙන යායුතු කොළඹ නගරයේ ආර්ථික මර්මස්ථාන වන වරාය හා ප්‍රභූ නිල නිවාස, ප්‍රධාන රාජ්‍ය ආයතන, ප්‍රධාන මාධ්‍ය ආයතන වන රූපවාහිනී සංස්ථාව, ගුවන් විදුලි සංස්ථාව හා ඡන්ද විමසීම හා ගණන් කිරීම සිදුකරනු ලබන මධ්‍යස්ථානවල සේවා සැපයිය යුතු බැවින් එම අත්‍යවශ්‍ය සේවාව ඉටුකරන ලංකා විදුලිබල මණ්ඩලයේ බලාගාර, හුවමාරු හා නඩත්තු මධ්‍යස්ථාන සේවකයින්;
- මාර්ග සංවර්ධන අධිකාරියේ පැය 24 පුරා අඛණ්ඩව සේවා පවත්වාගෙන යායුතු අධිවේගී මාර්ග පිවිසුම් හා නඩත්තු අංශයන් හි සේවා නියුක්ත සේවකයින්;
- ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ පැය 24 පුරා අඛණ්ඩ සේවා පවත්වාගෙන යායුතු ඇමතුම් මධ්‍යස්ථානවල සේවය කරන සේවකයින්;
- සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් සමාගමේ ඉන්ධන ගබඩා පිහිටි කොලොන්නාව, මුතුරාජවෙල ආරක්ෂක රාජකාරි ඉටුකරන සේවා නියුක්ත සේවකයින්;
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ඡන්ද විමසීම් දින විකාශන කටයුතු සඳහා සම්බන්ධවන සේවකයින්;
- 2020 වර්ෂයේ දී අනපේක්ෂිතව රට තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය පාලනය කිරීමේ සම්පූර්ණ වගකීම සෞඛ්‍ය කාර්යය මණ්ඩල වෙත සෘජුවම පැවරිණ. ඒ වෙනුවෙන් පැය 24 පුරාවට සෞඛ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් ස්වකීය දායකත්වය නොඅඩුව ලබා දෙමින් කොවිඩ් වසංගත පාලන කටයුතුවල නියැලූණි. ඡන්ද දායකයන්ගේත්, ඡන්ද විමසීම් කාර්යය මණ්ඩලවලත් සෞඛ්‍යාරක්ෂාව පවත්වා ගනිමින් වසංගත රෝග පාලන නීති රීති යටතේ ඡන්ද විමසීම පැවැත්වීමට සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල සහාය ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවක්ව පැවතිණ. රට තුළ කොඩිව් වසංගත පාලනය, මහජන සෞඛ්‍ය නිසි පරිදි පවත්වාගෙන යාම සහ ඡන්ද විමසීම පැවැත්වීමේ දී සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද පිළිපැදීම බලාත්මක කිරීමේ කාර්යයන් සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩල සේවයේ යෙදවීමට සිදුවී ඇති හෙයින්, පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26 (2) (ආ) හි දැක්වෙන විධිවිධාන අනුව 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී සෞඛ්‍යය කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ද;

තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම ලබා දීමට මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

## 8. තැපැල් ඡන්ද අයදුම් කිරීම සඳහා පහසුකම් සැලසීම

මෙම පහසුකම ලබා ගැනීම සඳහා අදාළ පනත්වල දැක්වෙන ආකෘතියට සාරානුකූල වූ ආකෘතියකින් අයදුම් කළ යුතු වේ. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත එවිය යුතු අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා, අයදුම්කරුවන්ට තම ලියාපදිංචිය පිළිබඳ විස්තර, ඡන්දහිමි නාමලේඛනවලින් පරීක්ෂාකර ලබා ගැනීම අවශ්‍ය වේ. එම කාර්යය පහසුකරවීම් වස් ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවල ඡන්ද විමසීමට වලංගු ඡන්දහිමි නාමලේඛන, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද, ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අදාළ වන පරිදි ග්‍රාම නිලධාරී කාර්යාලවල ද ප්‍රදර්ශනය කෙරේ. එයට අමතරව රජයේ නිලධාරීන් බහුතරයක් ස්ථානගත වී සිටින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, කම්කරු මහ ලේකම් කාර්යාලය, අධ්‍යාපන අමාත්‍යාංශය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, තැපැල් මූලස්ථානය, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, සෙත්සිරිපාය පළමු අදියර කාර්යාල සංකීර්ණය යන කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාල පිහිටි පරිශ්‍රවල ද ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනයට අවශ්‍ය පියවර ගනු ලැබේ. පසුකාලීනව ආරක්ෂක අංශවල සාමාජිකයින් හා පොලිස් නිලධාරීන් දිවයින පුරා පිහිටා ඇති සේවා ස්ථානවල සේවය කරනු ලබන බැවින්, ත්‍රිවිධ හමුදාවට හා පොලීසියට අදාළ සේවා ස්ථානවල, තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලුම් කරන්නන්ගේ ලියාපදිංචි තොරතුරු පරීක්ෂා කර බැලීමට, සංයුක්ත තැටි වශයෙන් සකසන ලද ඡන්දහිමි නාමලේඛන පිටපත්, මැතිවරණ මහ ලේකම් කාර්යාලයෙන් එම කාර්යාලවල සහතික කිරීමේ නිලධාරීන්ට ලබා ගැනීමට ඉඩ සලසා දී තිබේ. ඊට අමතරව මෙම තොරතුරු ලබා දීම සඳහාම මැතිවරණ මහලේකම් කාර්යාලයේ ස්ථාපිත කර තිබූ විශේෂ දුරකථන මාර්ගවලින් ද, 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය මගින්ද මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිසීමෙන් ද අවශ්‍ය අයට ඡන්දහිමි නාමලේඛනයේ තම ලියාපදිංචි විස්තර ලබා ගැනීමට පහසුකම් සලසා දී තිබිණි. තැපෑලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් අයදුම් කරන්නන් ඒ පිළිබඳව දැනුම්වත් කිරීමට භාෂාත්‍රයෙන් ම පුවත්පත් දැන්වීම් ද පළ කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ සම්ප්‍රදායක්ව පවතී.

## 9. තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීම

එක් එක් තේරීම්භාර නිලධාරීන් වෙත ලැබෙන සියළුම තැපැල් ඡන්ද අයදුම්පත් පරීක්ෂාකර ඒවා පිළිගත් බව හෝ ප්‍රතික්ෂේප කළ බවට වන දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ තීරණ, අයදුම්කරුවන්ට ද පිටපතක් සහිතව ඔවුන්ගේ සහතික කිරීමේ නිලධාරීන් වෙත දන්වා යැවිය යුතු වේ. තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට විවිධ කරුණු හේතු විය හැකි ය.

1. තේරීම්භාර නිලධාරියා වෙත නියමිත කාලය තුළ දී අයදුම්පත් නොලැබීම.;
2. තැපැල් ඡන්ද හිමිකම නොමැති වීම.;
3. අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ඉල්ලුම්කරුගේ විස්තර නිවැරදි ලෙස සටහන් නොකිරීම හෝ අඩුපාඩු සහිතව සටහන් කිරීම.;
4. සහතික කිරීමේ නිලධාරියා විසින් හෝ අයදුම්කරු විසින් හෝ අයදුම්පත අත්සන් නොකිරීම.;
5. සහතික කිරීමේ නිලධාරියාගේ තොරතුරු සනාථ නොවීම ආදී කරුණු තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට බලපාන ප්‍රධාන හේතු ලෙස දැක්වීමට පිළිවන.

## 10. තැපැල් ඡන්ද නාමලේඛන සකස් කිරීම

සියළුම මැතිවරණ පනත්වල උපලේඛනයේ දැක්වෙන පරිදි තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ නියෝග මාලාවේ සඳහන් නියෝග අනුව තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුව සකස් කිරීම සඳහා එක් එක් තැපැල් ඡන්ද හිමියා වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචියට අදාළ තොරතුරු සහ එම අයගේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ නම, තනතුර හා රාජකාරී ලිපින හා ජාතික හැඳුනුම්පත් අංක අවශ්‍ය වේ. තැපැල් ඡන්ද නාම ලේඛනය සකස් කිරීමේ දී සහතික කිරීමේ නිලධාරියාගේ ඉහතින් සඳහන් විස්තර ද අවශ්‍ය වේ. මෙම තොරතුරු පරිගණකගත කෙරේ. එසේම එක් එක් තැපැල් ඡන්ද දායකයාගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු ඡන්දහිමි නාමලේඛනයට අදාළ පරිගණක වැඩසටහනේ පහසුකම් උපයෝගී කර ගනිමින් තැපැල් ඡන්ද නාමලේඛනය සකස් කරනු ලැබේ. වර්තමානයේ දී තැපැල් ඡන්ද නාමලේඛනය දෘඪ පිටපත් හා මෘදු පිටපත් සහිත සංයුක්ත තැටි (CD) වශයෙන්

සකස් කරනු ලබන අතර, තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙත දෙනු ලබන්නේ සංයුක්ත තැටි (CD) පමණි.

## 11. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම

දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාල හෝ විශේෂයෙන් තෝරා ගන්නා ලද රජයේ කාර්යාල, රජයේ පාසල්වල දී තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සිදු කරනු ලැබේ. මෙම කාර්යය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ පූර්ණ සහය හිමිවේ. පූර්ව ඡන්ද විමසීම්වල දී මෙම කාර්යය එක් දිනක දී අවසන් කළ ද, පසුකාලීනව තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම දින කිහිපයක දී සිදු කරන ලදී. එසේ නිකුත් කිරීම සිදු කරන බව හා එක් එක් නිකුත් කිරීමේ මධ්‍යස්ථාන සඳහා පත් කළ හැකි නියෝජිතයන් සංඛ්‍යාව පිළිබඳව තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙත තේරීම්භාර නිලධාරී විසින් දැනුම් දිය යුතු බවට අදාළ පනත්වල සඳහන් වේ.

## 12. තැපැල් ඡන්ද ක්‍රියාවලියේ විශේෂ සංසිද්ධීන්

| වර්ෂය හා දිනය | ක්‍රියාවලිය සම්බන්ධ විශේෂ සංසිද්ධි |
|---|---|
| 1959 | • 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) ආඥා පනත 1959 අංක 11 දරණ සංශෝධන පනත හා එහි 5 වන උපලේඛනය මඟින් තැපැල් ඡන්ද නියෝග මාලාව හඳුන්වා දීම. |
| 1960 මාර්තු 19 | • තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රමවේදය පළමුවරට ක්‍රියාත්මක කිරීම.<br>• රාජ්‍ය සේවකයන් 18,246ක් සඳහා තැපැල් ඡන්ද පහසුකම් සලසා දී තිබුණි. |
| 1965 මාර්තු 22 | • ලංගම සේවකයන් සඳහා හා පළාත් පාලන සේවයේ සේවකයින්ට තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම හිමිවිය.<br>• තැපැල් ඡන්ද ක්‍රියාවලියට අදාළ උපදෙස් මාලාවක් ප්‍රථම වතාවට නිකුත් කරන ලදී.<br>• 34,000 දෙනෙකු තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කොට තිබුණි. |
| 1977 ජූලි 21 | • පස්වරු 6.00 සිට තැපැල් ඡන්ද පෙට්ටි විවෘත කිරීම හා අදාළ ව්‍යවස්ථාපිත කාර්යයන් නිම කොට ගණන් කිරීමේ කටයුතු ආරම්භ කරන ලද්දේ මෙම මැතිවරණයේ දී ය. |
| 1989 පෙබරවාරි 15 | • තැපෑලෙන් ඡන්දය දීම සඳහා දින දීර්ඝ කිරීමක් සිදුකර ඇත. |
| 1990 දශකය | • කවර මුද්‍රා තැබීම සඳහා එහෙත් භාවිත කළ ලාකට වෙනුවට ස්ටිකර් හඳුන්වාදීම.<br>• ප.ව. 4.00 ට තැපැල් ඡන්ද පෙට්ට විවෘත කිරීම හා ගණන් කිරීම ආරම්භ කිරීම. |
| 2000 දශකය | • තැපැල් ඡන්ද පත්‍රිකව හා ව්‍යවස්ථාපිත ලේඛන යැවෙන B හා C කවර සඳහා ප්ලාස්ටික් HDP කවර යොදා ගැනීම ආරම්භ කිරීම.<br>• තැපැල් ඡන්ද පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ ලිපි නිලධාරියාගේ කාර්යාලයීය ලිපිනයට අමතරව පෞද්ගලික ලිපිනයට යැවීම ආරම්භ කිරීම. |
| 2000 ඔක්තෝබර් 10 | • ප්‍රථම වරට තැපැල් ඡන්ද සලකුණු කිරීම අධීක්ෂණය සඳහා නිලධාරීන් පත් කිරීම සිදු කරන ලදී. |
| 2010 | • විශේෂයෙන් හඳුනාගන්නා ලද අත්‍යවශ්‍ය සේවා සපයන ආයතනවල සීමිත පිරිසකට තැපැල් ඡන්ද පහසුකම් සලසා දීම. |
| 2018 පෙබරවාරි 10 | • පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී එක් එක් කොට්ඨාස මට්ටමින් තැපැල් ඡන්ද ඇතුළත් D කවර වෙන් කිරීම, ඒවා කොට්ඨාස වෙත රැගෙන යාම හා එහිදී ගණන් කිරීම. මෙම ක්‍රියාවලියේ දී තැපැල් ඡන්ද ප්‍රතිඵල වෙනම ප්‍රකාශයට පත් නොකෙරේ. |
| 2020 අගෝස්තු 05 | • කොවිඩ් වසංගතය හේතුවෙන් සෞඛ්‍ය සේවයේ නිලධාරීන්/ සේවකයන් වෙත මෙම ඡන්ද විමසීමේ දී තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දී තිබුණි. |

## 13. තැපැල් ඡන්ද සලකුණු කිරීම

තැපැල් ඡන්ද ක්‍රියාවලිය ආරම්භ කාලසීමාවේ දී තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට ස්වකීය තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා එක් දිනයක් පමණක් වෙන් කොට ඇත. නමුත් අයදුම්පත්‍ර සංඛ්‍යාව අධික වීම, සේවා කාණ්ඩ ගණනාවක් පැවතීම, සෑම සලකුණු කිරීමේ ස්ථානයකටම ආරක්ෂාව සැලසිය යුතු වීම හා ඒවා අධීක්ෂණයට තේරීම්භාර නිලධාරී නියෝජිතයන් යෙදවිය යුතු වීම යන කරුණු හේතුකොටගෙන පසුකාලීනව ඡන්ද විමසීම්වල දී එය සීමිත දින ගණනකට සීමා කොට ඇත. ඒ පිළිබඳ තොරතුරු මතු දක්වා ඇත.

- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, මැතිවරණ මහලේකම් කාර්යාල
- පොලිස් දෙපාර්තමේන්තුව හා ප්‍රභූ ආරක්ෂක කොට්ඨාසවල
- සෙසු සියලුම රජයේ කාර්යාල
- සියලුම ආරක්ෂක හමුදා කඳවුරු
- සංස්ථා/ මණ්ඩල හා පාසැල්වල

සාමාන්‍ය ඡන්ද දායකයන්ට ස්වකීය ඡන්දය සලකුණු කිරීම සඳහා ලබාදෙනු ලබන පහසුකම් සියල්ල තැපැල් ඡන්ද මධ්‍යස්ථාන සඳහා ද අදාළ විය යුතු හා එක සමාන වැදගත්කමක් උසුලයි. මෙම උභය ස්ථානයන් සඳහා එක හා සමාන පහසුකම් සැපයිය යුතු වේ. ඒ අනුව තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලය ද නියමිත දින සාමාන්‍ය ඡන්ද පොළක අයුරින් ව්‍යවස්ථාපිතව සිදු කළ යුතු කටයුතු සියල්ල ඉටු කෙරේ. ඒ සඳහා නිලධාරීන්, පක්ෂ නියෝජිතයන්, මැතිවරණ නිරීක්ෂකයන් මෙන්ම 2000 වර්ෂයේ සිට සලකුණු කිරීමේ දී යම් යම් අක්‍රමිකතා සිදුවෙතැයි අපේක්ෂා කළ ස්ථාන සඳහා එවැනි අනීතික ක්‍රියා වැළැක්වීම් වස් විශේෂයෙන් පුහුණු කරනු ලැබූ තේරීම්භාර නිලධාරීන්ගේ විශේෂ නියෝජිතයන්ගේ අධීක්ෂණයෙන් ද සමන්විතව ඇත. වර්තමානයේ දී සියළුම සලකුණු කිරීමේ මධ්‍යස්ථාන කටයුතු අධීක්ෂණය සඳහා තේරීම්භාර නිලධාරීගේ විශේෂ නියෝජිතයන් ස්ථිතික හා ජංගම අයුරින් සේවයේ යොදවනු ලැබේ.

එක් එක් සලකුණු කිරීමේ මධ්‍යස්ථානයේ දී සලකුණු කරනු ලබන තැපැල් ඡන්ද පැකට්ටු එදිනම තැපැල් මගින් හෝ තේරීම්භාර නිලධාරී කාර්යාලයට ආසන්න එම පරිශ්‍රයේ පිහිටා ඇති කාර්යාලයක නම් අතින් ගෙනවිත් භාරදීම සිදුකළ යුතු අතර, සලකුණු කරන ලද පැකට්ටු මොන යම් හේතුවක් නිසාවත් සලකුණු කිරීමේ නිලධාරියා භාරයේ තබා ගනු නොලැබේ.

එසේම එක් එක් තේරීම්භාර නිලධාරී විසින් නිකුත් කරන ලද තැපැල් ඡන්ද පැකට්ටු සලකුණු කිරීම අවසානයේ දී නැවත තේරීම්භාර නිලධාරීන් වෙත ලැබීමේ දී ඒවා නිසි පරිදි ලැබී තිබේ ද යන්න මෙන්ම තුලනය වී තිබේ ද යන්න තේරීම්භාර නිලධාරී විසින් නිසැක වීම සිදුකරන අතර ඒ සඳහා රහස්‍ය අංක යෙදීම හෝ QR කේත යොදාගැනීම වර්තමානයේ දී සිදු කෙරේ.

## 14. තැපැල් ඡන්ද ගණන් කිරීම

වර්තමානයේ දී තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම ඡන්ද විමසීම අවසානයේ දී පස්වරු 4.00ට පමණ ආරම්භ කෙරේ. ඒ අනුව තැපැල් ඡන්ද ප්‍රතිඵල සෙසු ඡන්ද ප්‍රතිඵලවලට කලින් නිකුත් කිරීම සම්ප්‍රදායක්ව පවතී. තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම සම්බන්ධ ක්‍රියාවලිය ඉහත දක්වන ලද සෑම පනතකම උපලේඛනවල පැහැදිලිව විස්තර කොට ඇත.

සහතික කිරීමේ නිලධාරීන් මගින් සලකුණු කොට ආපසු ලැබෙන තැපැල් ඡන්ද පැකට්ටු ආරක්ෂිතව තබාගැනීම සඳහා තේරීම්භාර නිලධාරී කාර්යාලවල විධිමත් වැඩ පිළිවෙලක් තිබේ. ඒ සඳහාම වගකීම පැවරූ සහකාර තේරීම්භාර නිලධාරීවරයකු පත් කොට ඔහුගේ අධීක්ෂණය යටතේ ඡන්ද ගණන් කිරීම දක්වා කාලය තුළ ආපසු ලැබෙන තැපැල් ඡන්ද පැකට්ටු අදාළ පෙට්ටිවලට බහාලීම සිදු කෙරේ.

**තැපැල් ඡන්ද ගණන් කිරීමේ ක්‍රියා පටිපාටියේ මූලිකාංග**

- ඡන්ද විමසීම අවසානයේ දී තේරීම්භාර නිලධාරී විසින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් වෙත භාරදෙනු ලබන එක් එක් පෙට්ටියේ තිබෙන තැපැල් ඡන්ද සංඛ්‍යාව ඇතුළත් තොරතුරු සමඟ පරීක්ෂා කොට එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අදාළ තැපැල් ඡන්ද පෙට්ටි ගණන් කිරීමේ නියෝජිතයන්/ නිරීක්ෂකයන් ඉදිරියේ විවෘත කිරීම.
- ඡන්ද පෙට්ටි විවෘත කොට තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු ආවරණ ලිපි කවර සංඛ්‍යාව ගණනය කොට තේරීම්භාර නිලධාරීන් විසින් ලබාදෙන ලද සංඛ්‍යා සටහන් සමඟ සත්‍යාපනය කිරීම.
- ඡන්ද පත්‍රිකාව සමඟ අමුණා ඇති අනන්‍යතා ප්‍රකාශ නිසි පරිදි සම්පූර්ණ කොට තිබේ ද යන්න සහ අදාළ ඡන්ද පත්‍රිකාවේ අංකය සමඟ සැසඳේදැයි පරීක්ෂා කොට ඡන්ද පත්‍රිකා හා අනන්‍යතා ප්‍රකාශ වෙන වෙනම බඳුන්වලට දැමීම.
- ඡන්ද පත්‍රිකා ගණන් කිරීම, ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා හා අනන්‍යතා ප්‍රකාශ මුද්‍රා තැබීම.
- ගණන් කිරීම පිළිබඳ වාර්තාව සකස් කොට තේරීම්භාර නිලධාරී වෙත භාරදීම.

**සැ.යු. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී එක් එක් ඡන්ද කොට්ඨාසයට අයත් තැපැල් ඡන්ද එකී කොට්ඨාසයේ ගණන් කිරීමේ මධ්‍යස්ථානවලදී ගණන් කිරීම සිදු කරනු ලැබේ.**

## 15. තැපැල් ඡන්ද ක්‍රියාවලියේ නව ප්‍රවනතා

- **පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීම (Advance Voting)**

පසුගිය ඡන්දවිමසීම් පිළිබඳව පසු විපරම් කිරීමේ දී පනතේ විධිවිධාන අනුව තැපැල් ඡන්දය දීම සඳහා සුදුසුකම් නොලබන එහෙත් ඡන්ද විමසීම් දිනයේ දී අත්‍යාවශ්‍ය රාජකාරීවල නිරත වන සෞඛ්‍ය කාර්ය මණ්ඩල, වරාය, අධිවේගී මාර්ග, ගුවන් තොටුපළ, ජල සම්පාදන, මාධ්‍ය, විදුලිබල, රේගු වැනි ආයතනවල සේවකයන් රාශියකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවකාශ නොලැබේ. එසේම රාජ්‍ය ආයතන නොවුව ද ආයෝජන ප්‍රවර්ධන කළාපවල කර්මාන්ත ශාලා, ඇඟලුම් නිෂ්පාදන ආයතන, මාධ්‍ය ආයතන, ඖෂධහල්, බහුදින ධීවර යාත්‍රා, සංචාරක හා ආපන ශාලා, සුපිරි වෙළඳසැල් ආශ්‍රිතව සේවය කරන බහුතර සේවක පිරිසකට ද මෙම තත්ත්වය සෘජුවම බලපා තිබේ. ඡන්ද විමසීම් දිනයේ දී මෙවැනි බොහෝ පාර්ශ්වවල ඉල්ලීම්වලට සවන් යොමු කිරීමට මැතිවරණ බලධාරීන්ට මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයන්ට ද සිදුව තිබේ. වර්තමානයේ පවත්නා නීතිමය තත්ත්වය තුළ තේරීම්භාර නිලධාරීන් ඇතුළු මැතිවරණ බලධාරීන්ට ඒ වෙනුවෙන් කළ හැකි විකල්පයක් නොතිබුණ ද එවැනි ඉල්ලීම්වලට සවන් දීම සඳහා කාලය මිඩංගු කිරීමට සිදුව තිබේ. එබැවින් මෙම සේවා නියුක්තිකයන් සඳහා ද ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන පරිදි නීති රීති සංශෝධනය කිරීම කාලීන අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමක් වනු ඇත. මේ පිළිබඳව විදේශයන්හි පවත්නා ක්‍රමවේද පිළිබඳව සමාජය තුළ පුළුල් කතිකාවතක් ඇතිව තිබේ. එසේම දැනට තැපැල් ඡන්ද ක්‍රියාවලියේ පවත්නා සංකීර්ණතාව, ඒ සඳහා වැය වන කාලය, ශ්‍රමය හා මුදල අධික වීම යන කරුණු මෙන්ම විදේශ මැතිවරණ ආයතන මෙවැනි තත්ත්වයන් සඳහා අනුගමනය කරන ක්‍රමවේද අධ්‍යයනය කොට ඡන්ද හිමි නාමලේඛනයේ නම් සඳහන් තැනැත්තන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට වැඩි ඉඩ ප්‍රස්තා ඇති කිරීම තුළින් ඡන්ද ප්‍රකාශ කරන සංඛ්‍යාව ඉහළ අගයක් දක්වා වර්ධනය කර ගැනීම සඳහා සාධනීය යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි නීති රීති සංශෝධනයට පියවර ගැනීම යුගයේ අවශ්‍යතාවකි. එබැවින් නිශ්චිතව හඳුනාගනු ලබන අත්‍යවශ්‍ය සේවා නියුක්තිකයන් සඳහා ඡන්ද විමසීම් දිනට පූර්වයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට (Advance Voting) අවස්ථාව සැලසීම හෝ ඡන්ද විමසීම් දින විශේෂ ඡන්ද පොළවල් පිහිටුවා එම ඡන්ද පොළක දී හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට පහසුකම් සලසා දීම සඳහා පවත්නා නීති රීති සංශෝධනය කිරීම කළ යුතුව පවතී.

- **විශේෂ ඡන්ද පොළවල් (Special Poling Station)**

ඡන්ද විමසීමට පූර්වයෙන් එබැවින් නිශ්චිතව හඳුනාගනු ලබන අත්‍යවශ්‍ය සේවා නියුක්තිකයන් අතරින් ඡන්ද විමසීම් දිනයේ දී සක්‍රිය රාජකාරියේ නිරත වීම හේතුවෙන් සෘජුව ඡන්ද මධ්‍යස්ථානයට ගොස් ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව නොලැබෙන බව පෙනී යන ඡන්ද දායකයන් සඳහා ඡන්ද විමසීම් දිනට පූර්වයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට ඡන්ද විමසීම් දින, විශේෂ ඡන්ද පොළවල් පිහිටුවා එම ඡන්ද පොළක දී හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට පහසුකම් සලසා දීම සඳහා පවත්නා නීති රීති සංශෝධනය කිරීම කළ යුතුව තිබේ.

පාර්ශ්වකාර කණ්ඩායම් වෙතින් ලද අදහස් හා යෝජනා අනුව විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හා විදේශයන්හි සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීම (Overseas Voting) සඳහා කාලයක පෙර සිටම කටයුතු ආරම්භව පැවතිණි. ඒ සඳහා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවක් ද පත්කොට තිබූ අතර, පසුකාලීනව එම කටයුතු අත්හැර දමා තිබුණි. එයට අමතරව බන්ධනාගාරගතව සිටින රැඳවියන් සඳහා ද ජාතික මට්ටමේ මැතිවරණ වන එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය හා ජනමත විචාරණය වැනි මැතිවරණවල දී ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමුව ඇත. එබැවින් මෙම සියලුම කණ්ඩායම් සඳහා ද ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන පරිදි අදාළ නීති සංශෝධනය විය යුතුව තිබේ. මෙහි දී විදේශගත විශාල ශ්‍රමික පිරිසක් මැදපෙරදිග රටවල ගෘහස්ථ සේවයේ යෙදී සිටීම ද, සමහර තානාපති කාර්යාල හා එම නිවෙස් අතර දුර ප්‍රමාණයන් ද, ඔවුනට නිවාඩු ලබා ගැනීමේ දුෂ්කරතාව මෙන්ම ඡන්දයේ රහස්‍ය බව ආරක්ෂා වීම සහ පෙළඹවීම් හා වෙනත් අකටයුතුකම්වලට ඉඩ නොතැබීම ද යන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුව පවතී.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව*
2. *මැතිවරණ හා ඡන්ද විමසීම් පනත්*
3. *සර්වජන ඡන්ද බලය, 85 සංවත්සර ග්‍රන්ථය : ප්‍රකාශනය - මැතිවරණ කොමිෂන් සභාව*
4. *මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තැපැල් ඡන්ද චක්‍රලේඛ හා උපදෙස්*

# සුපිලිපන් මැතිවරණයක් උදෙසා තොරතුරු අයිතිය


නීතිඥ ජගත් ලියන ආරච්චි
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාවේ සාමාජික


ප්‍රජාතන්ත්‍රවාදයේ මහෝත්සවය මැතිවරණය ලෙස සලකනු ලැබේ. එබැවින් මැතිවරණයක සුපිළිපන් බව අතිශයින්ම වැදගත් වේ. එකී සුපිළිපන් බව සියුම් පරීක්ෂාවට ලක් කිරීමේ අයිතිය සහ හැකියාව සෑම ඡන්දදායකයකුටම පවතින්නේ නම් මැතිවරණය කෙරෙහි ජනතා විශ්වාසය තහවුරු වේ. මැතිවරණයක් ආශ්‍රිත සමස්ථ ක්‍රියාවලිය සියුම් පරීක්ෂාවකට ලක් කිරීමේ හැකියාව තොරතුරු අයිතිය මගින් ඡන්දදායකයන්ට ලබාදී තිබේ. මෙම කෙටි සටහන මැතිවරණ ක්‍රියාවලියේ සුපිළිපන් බව ආරක්ෂා කිරීමට හා පරීක්ෂා කිරීමට තොරතුරු අයිතිය භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමකි.

### තොරතුරු අයිතිය

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 3 වන වගන්තියට අනුව පොදු අධිකාරියක භාරයේ පාලනයේ හෝ සන්තකයේ පවතින තොරතුරු සඳහා පුරවැසියන්ට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම පවතී. මෙම අයිතිවාසිකම සීමා වන්නේ පනතේ 5(1) වගන්තියේ දක්වන සීමාවලට පමණි.

සියලුම රාජ්‍ය ආයතන පොදු අධිකාරිය යන අර්ථ නිරූපනය යටතට ගැනෙන බැවින් ඕනෑම රාජ්‍ය ආයතනයක සන්තකයේ භාරයේ හෝ පාලනයේ පවතින තොරතුරු සඳහා මෙම අයිතිවාසිකම පවතී.

### මැතිවරණ කාලසීමාවකදී තොරතුරු අයිතිය භාවිතා කළ හැකි පාර්ශ්ව

තොරතුරු අයිතිය සෑම පුරවැසියකුම සතු අයිතිවාසිකමක් බැවින් මැතිවරණ කාලසීමාවකදී පහත පාර්ශවකාර කණ්ඩායම් සඳහා සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ දී මෙම අයිතිය බහුලව භාවිතා කළ හැකිය.

- අපේක්ෂකයන්;
- දේශපාලන පක්ෂ;
- මැතිවරණ නිරීක්ෂකයන්;
- දේශපාලන ක්‍රියාකාරීන්;
- සමාජ ක්‍රියාකාරීන්; වේ.

### මැතිවරණයක සුපිළිපන් බව උදෙසා තොරතුරු අයිතිය භාවිතා කළ හැකි අවස්ථා

මැතිවරණයක් හා සම්බන්ධ අවස්ථා ගණනාවක දී තොරතුරු අයිතිය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව පුරවැසියන්ට හිමිවේ.

- ඡන්දදායකයන් ලියාපදිංචිය - යම් ඡන්දදායකයෙකු නියමිත පරිදි ලියාපදිංචි වී තිබේද යන්න තොරතුරු අයිතිය මගින් පරීක්ෂා කළ හැකිය.
- රාජ්‍ය සම්පත් අවභාවිතා කිරීම - මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය නිළධාරීන්, පරිශ්‍ර සහ වාහන යම් දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් අවභාවිතා කරන්නේද යන්න තොරතුරු අයිතිය මගින් පරීක්ෂා කළ හැකිය;
- මැතිවරණ නීති ක්‍රියාත්මක වීම- නීති ක්‍රියාත්මක කිරීම පිළිබදව විශේෂයෙන්ම නඩු පැවරීම, විනය ක්‍රියාමාර්ග ගැනීම, අත් අඩංගුවට ගැනීම ආදී තොරතුරු ලබාගැනීම,

### තොරතුරු ලබාගැනීමේ ක්‍රියාවලිය

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ තොරතුරු සඳහා පුරවැසියකුට ප්‍රවේශ වීම සඳහා ප්‍රවේශ දෙකක් පවතී. ඒවා නම්,

- ප්‍රගාමී තොරතුරු හෙලිදරව් කිරීම මගින් - නිතර අවශ්‍යවන තොරතුරු ස්වේච්ඡාවෙන් ප්‍රසිද්ධ කිරීම සඳහා පොදු අධිකාරීන්ට පවතින නීතිමය වගකීම යටතේ වෙබ් අඩවිවල සහ ප්‍රදර්ශන පුවරුවල ප්‍රදර්ශනය කරන තොරතුරු මගින් ;
- ලිඛිතව සිදුකරන තොරතුරු ඉල්ලීමක් මගින් - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ ප්‍රතිපාදන අනුව අදාල තොරතුරු පවතින පොදු අධිකාරියේ තොරතුරු නිලධාරී වෙත ඉදිරිපත් කරන තොරතුරු ඉල්ලීමක් මගින් තොරතුරු ලබා ගැනීම,

### තොරතුරු ඉල්ලීමක් මගින් තොරතුරු ලබාගැනීමේ ක්‍රියාවලිය

තොරතුරු ඉල්ලීමක් ලිඛිතව (ලිඛිතව යන්නට විද්‍යුත් ආකාරයෙන් සිදු කිරීමද ඇතුළත් වේ.) තොරතුරු පවතින පොදු අධිකාරියේ තොරතුරු නිලධාරී වෙත යොමු කළ යුතු ය. එවිට තොරතුරු නිලධාරී විසින් එම තොරතුරු පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව ලබාදෙනවාද නැතහොත් ප්‍රතික්ෂේප කරනවාද යන්න වැඩකරන දින 14ක් ඇතුළත තොරතුරු ඉල්ලීම කළ පුද්ගලයාට දන්වනු ලැබේ. තොරතුර ලබාදෙන්නේ නම් ඒ සඳහා අයකරන ගාස්තුව කොපමණද යන්නද, තොරතුරු නිලධාරී දන්වනු ලැබේ. ඒ අනුව අදාල මුදල තැන්පත් කිරීමෙන් පසුව දින 14ක් ඇතුළත අදාල තොරතුර ලබාදිය යුතු ය.

තොරතුරු නිලධාරීගේ ප්‍රතිචාරයෙන් තෘප්තිමත් නොවන තොරතුරු ඉල්ලුම්කරුවෙකුට එම තීරණයට එරෙහිව අදාල පොදු අධිකාරියේ නම් කළ නිලධාරී වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. එම අභියාචනය, තොරතුරු නිලධාරීගේ

තීරණයෙන් දින 14ක් ඇතුළත සිදු කළ යුතු ය. එවිට නම් කළ නිලධාරී විසින් එම අභියාචනය විභාග කර දින 21ක් ඇතුළත සිය තීරණය ඉල්ලුම්කරු වෙත ලබාදිය යුතු ය. එකී තීරණයෙන් තෘප්තිමත් නොවන තොරතුරු ඉල්ලුම්කරුවෙකුට එම තීරණයට එරෙහිව මාස 2ක කාලයක් ඇතුළත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකිය. කොමිෂන් සභාවේ තීරණයෙන් ද අතෘප්තිමත් වන පාර්ශ්වවලට අභියාචනාධිකරණයට අභියාචනා කිරීමේ අයිතිය පවතී.

## තොරතුරු අයිතියේ පවතින සීමා

මැතිවරණය යනු නිශ්චිත කාල වකවානුවක් තුළ සිදුවී අවසන් වන ක්‍රියාවලියකි. එසේම මැතිවරණයක ප්‍රතිඵල අභියෝගයට ලක් කිරීම සඳහා ද නිශ්චිත කාල වකවානු නියම කර තිබේ. තොරතුරු දැනගැනීමේ පනත යටතේ සිදුකරනු ලබන තොරතුරු ඉල්ලීමක දී තොරතුරු ඉල්ලුම්කරුවෙකුට තොරතුරක් ක්ෂණිකව ලබාගත නොහැක. තොරතුරු නිලධාරියාට එම ඉල්ලීම සලකා බැලීම සඳහා වැඩකරන දින 14ක කාලයක්ද, මුදල් ගෙවීමෙන් පසුව එම තොරතුරු ලබාදීම සඳහා දින 14ක කාලයක්ද හිමිවේ, එබැවින් තොරතුරු ඉල්ලීමක් මගින් ලබාගන්නා තොරතුරු ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් එම තොරතුරු මැතිවරණ ක්‍රියාවලිය සඳහා මැතිවරණයට පෙර භාවිතා කළ හැකිද යන්න අභියෝගයක්ව පවතී,


නමුත් ප්‍රගාමීව හෙළිදරව් කළ යුතු තොරතුරු පොදු අධිකාරීන් විසින් හෙළිදරව් කර තිබෙන අවස්ථාවල දී මෙම අභියෝගය මතු නොවේ,

## තොරතුරු අයිතිය භාවිතා කර ජයගත් මොණරාගල ඡන්ද පෙත්සම

2018 වසරේ පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා මොණරාගල ප්‍රාදේශීය සභාව සඳහා මදුරුකැටිය කොට්ඨාශය සඳහා තරග කර ජයග්‍රහනය කළ අපේක්ෂකයාට එරෙහිව ඡන්දය ලබාගැනීම සඳහා අල්ලස් දීමේ චෝදනාව නගමින් ඡන්ද පෙත්සමක් ගොනු විය(මැතිවරණ පෙත්සම් අංක 1/2018, ඌව පළාත්බද මහාධිකරණය-මොණරාගල). පෙත්සම මගින් චෝදනා නගන ලද්දේ ඡන්දය ලබාගැනීම සඳහා අල්ලස් ලෙස නව ජල සබදතා සහ නව විදුලි සබදතා සඳහා එකී අපේක්ෂකයකුගේ ආධාරකරුවෙකු විසින් ඡන්දදායකයන් වෙනුවෙන් විදුලි බල මණ්ඩලයට සහ ජල සම්පාදන මණ්ඩලයට මුදල් බැද ඇති බවයි, එම කරුණු තහවුරු කිරීම සඳහා පෙත්සම්කරුවන් ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලද්දේ ජල සබදතා සහ විදුලි සබඳතා සඳහා පිළිවෙලින් ජලසම්පාදන මණ්ඩලයට සහ විදුලිබල මණ්ඩලයට මුදල් බඳින ලද කුවිතාන්සි පිටපත්ය. එම පිටපත් අනුව එකම පුද්ගලයකු එනම් අපේක්ෂකයාගේ ආධාරකරුවකු විසින් එම සියලු දෙනා සඳහා මුදල් තැන්පත් කර තිබිණි, එම රිසිට් පත් ලබාගෙන තිබුණේ තොරතුරු දැනැගැනීමේ පනත යටතේ සිදුකරන ලද තොරතුරු ඉල්ලීම් මඟිනි. පෙත්සම සාර්ථක වී ජයග්‍රාහී අපේක්ෂකයාට සභික ධුරය අහෝසි වී දෙවෙනියට ඡන්ද ලබාගෙන තිබූ පෙත්සම්කරුට සභික ධුරය පිරිනැමීමට අධිකරණය තීරණය කරන ලදී. මෙම තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ද තහවුරු කරන ලදී. (SC (SPL) Application 228-2021)

## 2025 නව වසරේ රාජකාරී ආරම්භ කිරීම





# මැතිවරණ කාලසීමාවේ දී විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්ති සංස්කරණයේ වගකීම් සහ අභියෝග


**සුරෝෂන ඉරංග**
සහකාර පුවත්පත් කොමසාරිස් - ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

වසර ගණනාවක් පුරා රූපවාහිනී සහ ගුවන්විදුලි මාධ්‍ය ආයතන ගණනාවක ජනමාධ්‍ය වෘත්තිකයෙකු ලෙස කටයුතු කරමින් මා ලැබූ අත්දැකීම්, මුහුණ පෑ අභියෝග සහ නිරීක්ෂණ මෙම ලිපිය සම්පාදනය කිරීම සඳහා උපයෝගී කර ගතිමි. විශේෂයෙන්ම රූපවාහිනී සහ ගුවන්විදුලි මාධ්‍ය ආයතනික ස්වරූප සහ අභ්‍යන්තර කළමනාකරණ ක්‍රමවේද ප්‍රවෘත්ති සංස්කරණ ක්‍රියාවලිය සඳහා ප්‍රමුඛ බලපෑමක් සිදුකරන බැවින් එම තත්ත්ව හමුවේ ප්‍රවෘත්ති සංස්කාරකවරයාගේ භූමිකාව එකී මාධ්‍ය ආයතනවල අභ්‍යන්තර ක්‍රියාකාරිත්වයට අනුරූපව ගොඩනැගෙන බව සඳහන් කළ යුතු ය. ඒ අනුව මැතිවරණ කාලසීමාවේ දී රූපවාහිනී සහ ගුවන්විදුලි ප්‍රවෘත්ති සංස්කරණ භූමිකාව එම ආයතනික අනන්‍යතා සහ සුවිශේෂතා මත පදනම්ව මෙම ලිපිය ඔස්සේ විග්‍රහ කරමි.

මැතිවරණයක් ප්‍රකාශයට පත්කළ දින සිට ප්‍රතිඵල ඉදිරිපත් කර අවසන් වන තෙක් ජනමාධ්‍ය වෘත්තිකයින්ට, විශේෂයෙන්ම ප්‍රවෘත්ති අංශයේ සහ කාලීන වැඩසටහන් අංශයේ නිලධාරීන්ට පැවරෙන වගකීම අතිමහත්ය. මැතිවරණය පිළිබඳ දෛනික තොරතුරු ජනතාව අතරට ගෙනයාමේ ප්‍රධාන මාධ්‍යය දෛනික ප්‍රවෘත්ති විකාශ වන අතර සම්මුඛ සාකච්ඡා හා දේශපාලන සංවාද වැනි වැඩසටහන් ඉදිරිපත් කරමින් කාලීන වැඩසටහන් අංශය ද මැතිවරණ කාලසීමාවේ දී ජනතාව දැනුම්වත් කිරීමේ මෙහෙවර ඉටුකරනු ලබයි. ඇතැම් අවස්ථාවල කාලීන වැඩසටහන්වල දී විවිධ දේශපාලඥයින් සහ මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ වන නිලධාරීන් ඉදිරිපත් කරනු ලබන අදහස් ප්‍රවෘත්ති ප්‍රකාශ තුළ දී ප්‍රචාරය කරන අතර ප්‍රවෘත්ති ප්‍රකාශවල ඉදිරිපත් වූ තොරතුරු මත පදනම්ව කාලීන වැඩසටහන් අන්තර්ගතය සකස් වන අවස්ථා ද බහුල වශයෙන් දක්නට ලැබේ. ඒ අනුව ප්‍රධාන වශයෙන් මෙම අංශ ද්විත්වයේ අන්තර් සම්බන්ධතාව මත මැතිවරණ කාලසීමාවේ දී තොරතුරු ජනතාව හමුවට ඉදිරිපත් කිරීම සිදුවේ.


මේ අනුව මැතිවරණ සමයේ දෛනිකව පැවැත්වෙන විවිධ දේශපාලන පක්ෂවල රැස්වීම් ආවරණය කිරීම විධිමත්ව සිදුවන අතර ඒ සඳහා මාණ්ඩලික වාර්තාකරුවන් මෙන්ම ප්‍රාදේශීය වාර්තාකරුවන් ද යෙදවීම සිදුකෙරේ. රාත්‍රී 6.55ට රූපවාහිනී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය වන බැවින් දිනය තුළ පැවති සෑම ප්‍රධාන රැස්වීමක් පිළිබඳවම තොරතුරු එහිදී ඉදිරිපත් කිරීම සිදුවේ. ඇතැම් දිනවල දිනයේ වඩාත් කාර්යබහුලම කාල සීමාව බවට ප්‍රවෘත්ති විකාශය වන කාලසීමාව පත්වේ. මක්නිසාද යත් එම කාල සීමාවේ වාර්තාකරුවන් වෙතින් ලැබෙන දර්ශන සංස්කරණය කර ඉතා කඩිනමින් ඉදිරිපත් කිරීමට සිදුවන බැවිනි. ප්‍රවෘත්ති අංශය ආසන්නයේම ප්‍රවෘත්ති මැදිරිය පිහිටා නොමැති අවස්ථාවල ප්‍රවෘත්ති සංස්කාරකවරයාටම නිවේදකයින්ට ලබාදීම සඳහා ප්‍රවෘත්ති පිටපත රැගෙන දිවයාමට සිදුවේ. මැතිවරණ කාල සීමාවක් නොවන සාමාන්‍ය දිනවලදී ද මෙවැනි අවස්ථාවලට මුහුණදීමට ඇතැම් විට සිදුවුව ද මැතිවරණ කාල කාලසීමාවේ දී වැඩි ප්‍රවෘත්ති සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමට සහ ඒ ඔස්සේ ඇතිවන කාර්යබහුල තත්ත්වය හේතුවෙන් එම සෑම අවස්ථාවක්ම මනාව කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය ශක්‍යතාව සංස්කාරකවරයා සතුවීම වැදගත්ය.

මැතිවරණ කාල සීමාවක ප්‍රවෘත්ති අංශයේ කටයුතුවලින් අනතුරුව මැතිවරණයෙන් පසු ප්‍රතිඵල විකාශය ද ප්‍රවෘත්ති අංශය යටතේ සිදුවන බැවින් එහිදී ද ප්‍රවෘත්ති අංශයේ සංස්කාරකවරුන්ට වැඩි වගකීමක් හා කාර්යභාරයක්



පැවරේ. ඒ සඳහා සාමාන්‍ය සේවාමුර වෙනුවට විශේෂ රාජකාරී සේවාමුර ක්‍රියාත්මක කෙරෙන අතර ආහාර සැපයීම සහ අතිරේක ප්‍රවාහන කටයුතු ද එහිදී ආයතනය වෙතින් සංවිධානය කෙරේ. ප්‍රතිඵල විකාශයේ දී වෙනත් රූපවාහිනී නාලිකාවල ඉදිරිපත් වන මැතිවරණ විකාශ, තොරතුරු සම්පිණ්ඩන කෙරෙහි ද අවධානය යොමුවන අතර වඩාත් පරිපූර්ණ හා නිරවද්‍ය තොරතුරු වඩාත් විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීමට ප්‍රවෘත්ති සංස්කාරකවරුන්, නිෂ්පාදකවරුන්, පරිගණක ග්‍රැෆික් නිර්මාණ ශිල්පීන්, මැදිරි කළමණාකරුවන් හා නිවේදකයින් ඇතුළු පාර්ශ්ව ගණනාවක් කටයුතු කරනු ලබයි. මැතිවරණ ප්‍රතිඵල විකාශයකදී සාමාන්‍ය අවස්ථාවල මැදිරියක සේවය කරන පිරිසට වඩා වැඩි පිරිසක් සේවය සඳහා යොදාගැනීම මෙහිදී සාමාන්‍ය තත්ත්වයකි.

2018 වසරේදී සහකාර ප්‍රවෘත්ති සංස්කාරකවරයෙකු ලෙස රාජ්‍ය ගුවන්විදුලි නාලිකාවක සේවයට මා එක්වීමෙන් පසු මැතිවරණ කාලසීමාවේ දී ප්‍රවෘත්ති ප්‍රකාශ මෙහෙයවීම සම්බන්ධයෙන් වඩාත් පුළුල් අත්දැකීම් ලබාගැනීමට හැකිවිය. ඊට හේතුව වන්නේ එක් ප්‍රවෘත්ති ප්‍රකාශයක් සංස්කරණය කිරීමේ පූර්ණ වගකීම සංස්කාරකවරයා වෙත පැවරීම හා ඊට අදාළ සියලු තීන්දු තීරණ ගැනීමේ පූර්ණ අයිතිය (ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා සහ ආයතනික ඉහළ නිලධාරීන්ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින්) ද සංස්කාරකවරයාට හිමිවීමයි. ඉකුත් ජනාධිපතිවරණ සහ මහ මැතිවරණ කාලසීමාවල ප්‍රවෘත්ති සංස්කරණය සම්බන්ධයෙන් අත්දැකීම් ගණනාවක් මා ලැබූ අතර එම අත්දැකීම් ද මෙම ලිපිය ඔස්සේ ඉදිරිපත් කරමි. මැතිවරණ කාලසීමාවේ දී ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදී මැතිවරණ කොමිෂන් සභාව මගින් නියමකර ඇති මාධ්‍ය උපමාන අනිවාර්යයෙන්ම සැලකිල්ලට ගැනීමට ප්‍රවෘත්ති සංස්කාරකවරු බැඳී සිටිති. එබැවින් මාධ්‍ය උපමාන උල්ලංඝණය නොවන පරිදි හැකි උපරිම අයුරින් කටයුතු කිරීම ප්‍රවෘත්ති සංස්කාරක භූමිකාවේ මා අත්විඳි යම් අසීරු අභියෝගයකි. මෙම තත්ත්වය හමුවේ පැනනගින ගැටළු නිරාකරණය කරගනිමින් හා ඇතැම් අවස්ථාවල ඒ පිළිබඳ ආයතනයේ ඉහළ නිලධාරීන් සමග සාකච්ඡා කරමින් ගත හැකි වඩාත් සුදුසු විසඳුම්වලට එළඹීමට සිදුවේ.






මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණක් වන්නේ ප්‍රවෘත්තියකට අදාළව හඬපටයක් යෙදීමේ දී එහි අන්තර්ගතය ද මාධ්‍ය උපමානවලට අනුකූල වන බවට සංස්කාරකවරයා ලෙස සෑහීමට පත්විය යුතු වීමයි. වාර්තාකරුවන් විසින් සිය අභිමතය පරිදි කවර අන්තර්ගතයක් සහිත හඬපටයක් ප්‍රවෘත්තිය සඳහා ඇතුළත් කර තිබුණ ද එය ප්‍රවෘත්ති ප්‍රකාශයක ඉදිරිපත් කිරීම පිළිබඳ අවසන් තීරණය ගනු ලබන්නේ සංස්කාරකවරයා විසිනි (ඇතැම් අවස්ථාවල ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ආයතනික ඉහළ නිලධාරීන්ගේ අදහස් ද සැලකිල්ලට ගනු ලැබේ). එය මූලික සංස්කාරක අයිතියක් වන අතර විශේෂයෙන්ම මැතිවරණ කාලසීමාවේ දී පවත්නා නීතිමය තත්ත්වයට ද අනුකූල වීමකි. නිදසුනක් ලෙස යම් හඬපටයක් තුළ යම් පාර්ශ්වයකට දැඩි අගතියක් සිදුවන අන්දමේ ප්‍රකාශ ඇතුළත් වන්නේ නම් මාධ්‍ය උපමාන අනුව එම හඬපටය සංස්කරණය කර ඉදිරිපත් කිරීමට හෝ එම හඬපටය ප්‍රවෘත්ති ප්‍රකාශයකට ඇතුළත් නොකර මුළුමනින්ම ඉවත් කිරීමේ පූර්ණ අයිතිය සංස්කාරකවරයා සතුවේ. මෙවැනි නීතිමය තත්ත්ව පිළිබඳ ප්‍රවෘත්ති අංශයේ සියලු නිලධාරීන් සතුව මනා අවබෝධයක් පැවතීම මෙම කටයුතු සාර්ථක කර ගැනීමට අතිශයින් වැදගත් බව අවධාරණය කළ යුතු ය.

මැතිවරණ කාලසීමාවේ දී රාජ්‍ය මාධ්‍ය ආයතනයක ප්‍රවෘත්ති සංස්කාරකවරයෙකු ලෙස කටයුතු කිරීමේදී පාර්ශ්ව ත්‍රිත්වයක් කළමනාකරණය කළ යුතු බව මාගේ නිරීක්ෂණයයි. මැතිවරණ කොමිෂන් සභාව, බලයේ සිටින හෝ සිටි දේශපාලන අධිකාරිය හා ආයතනයේ ඉහළ නිලධාරීන් එම පාර්ශ්ව ත්‍රිත්වය වේ. මෙම පාර්ශ්වවල අදහස් හා උපදෙස් නීතිමය රාමුව තුළ කළමනාකරණය කරමින් වඩාත් ගුණාත්මක හා සමබර ප්‍රවෘත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම සංස්කාරකවරයාගේ භූමිකාව වේ. එම තත්ත්වය සංකල්පීයව සිදුකරන පැහැදිලි කිරීම්වලින් ඔබ්බට ගිය අතිශය සංකීර්ණ හා ඇතැම් අවස්ථාවල මානසික වශයෙන් දැඩි පීඩනයට ලක්වන ක්‍රියාවලියක් බව ද මෙහි සටහන් කිරීම මගින් එහි පවත්නා ස්වභාවය පිළිබඳ යම් අවබෝධයක් ලැබීමට හැකි වෙතැයි විශ්වාස කරමි.

ඒ අනුව මැතිවරණ කාලසීමාවේ දී ප්‍රවෘත්ති සංස්කරණය කිරීමේ සංකීර්ණ ක්‍රියාවලිය ප්‍රවෘත්ති සංස්කාරකවරයා කේන්ද්‍රකර ගනිමින් ගොඩනැගී පැවතුණ ද පාර්ශ්ව ගණනාවක් එම ක්‍රියාවලිය මෙහෙයවීමේ හා සාර්ථකව ඉටුකිරීමේ වගකීම දරණ බව සඳහන් කළ යුතු ය. විශේෂයෙන්ම ප්‍රවෘත්ති සංස්කරණ ක්‍රියාවලියක පැවතිය යුතු අපක්ෂපාතී බව සහ නිරවද්‍යතාව වැනි මූලික ගුණාංග ආරක්ෂා කරමින් ප්‍රවෘත්ති සංස්කරණයේ නිරතවීම ඉතා අභියෝගාත්මක කාර්යයක් වන බැවින් එවැනි අවස්ථා මනාව කළමනාකරණය කර ගැනීමේ ශක්‍යතාව දැනුම, අවබෝධය සහ අත්දැකීම් තුළින් වර්ධනය කර ගැනීම සංස්කාරකවරයාගේ වගකීමකි. ප්‍රවෘත්ති පිළිබඳ න්‍යායික සංකල්ප පිළිබඳ දැනුම පමණක් එහිදී ප්‍රමාණවත් නොවන බැවින් එකී න්‍යායික සංකල්ප ප්‍රායෝගිකව භාවිතයට ගැනීමේ ක්‍රමෝපායන් ප්‍රගුණ කිරීම ද අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ප්‍රවෘත්ති සංස්කාරක වෘත්තියේ සාර්ථකත්වය යනු අභියෝගවලට මුහුණදෙමින් අත්දැකීම් ඔස්සේ වෘත්තිමය වගකීම දැරීමට අවශ්‍ය කුසලතා වර්ධනය කර ගැනීම බව අවසාන වශයෙන් සඳහන් කළ යුතු ය.




# පාර්ලිමේන්තු මැතිවරණය 2024 මැතිවරණ කොමිෂන් සභාවේ

## මාධ්‍ය නිවේදන සඳහා පුවත්පත්වලින් ලැබී ඇති ප්‍රචාරය

**නිපුනි ෂෙහානි දොම්පගේ සහ කේ.වී.පී.එෂාන් ලක්තිළිණ**
රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථී

විසිවන සියවස දෙවන භාගයේ දී විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ සිදු වූ අතිවිශාල වර්ධනය ජනසන්නිවේදන හා ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ සුවිශාල ගුණාත්මක හා ප්‍රමාණාත්මක විපර්යාස රැසක් සිදුවීමට තුඩු දුන්නේය. ලෝකයේ දිනෙන් දින නවතම පුවත් හා තොරතුරු නිර්මාණය වෙමින් පවතින අතර මේ තොරතුරු ජාලයේ නවතම පුවත්, නිවේදන හා වාර්තා ජනතාව වෙත ගෙන යාමට සෑම මාධ්‍ය ආයතනයකටම වගකීමක් තිබේ. ශ්‍රී ලාංකීය සංවර්ධන මාධ්‍ය අතර පුවත්පතට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. විශේෂයෙන් සමාජය තුළ ජනමතය නිර්මාණය හා හැසිරවීම සඳහා පුවත්පත් තුළින් ඇති කළ හැකි බලපෑම සුවිශාලය. මෙහිදී රජයේ ව්‍යවස්ථාපිත හා නිල කටයුතු පිළිබඳව නිවැරදි තොරතුරු ලබාදීම මගින් මහජනතාව දැනුම්වත් කිරීමෙහිලා පුවත්පත් මාධ්‍ය සතු වගකීම අතිමහත්ය. විශේෂයෙන් රාජ්‍ය ආයතනවලින් නිකුත් කරනු ලබන නිල නිවේදන පිළිබඳව නිසි කළට නිවැරදිව මහජනතාව දැනුම්වත් කිරීමට මාධ්‍ය කටයුතු කළ යුතු ය.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද විමසීම් කාලසීමාවේ දී මාධ්‍ය වෙත නිකුත් කරනු ලබන ව්‍යවස්ථාපිත කාර්යන් හා කාර්තව්‍යයන් ඇතුළත් තොරතුරු සඳහා මෙරට පුවත්පත් මාධ්‍ය තුළ කෙතරම් ඉඩක් වෙන් වී තිබේද යන්න සහ මෙම නිල නිවේදන සඳහා ලබා දී තිබෙන අවධානය පිළිබඳ සොයා බැලීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය විසින් විශේෂ සමීක්ෂණයක් සිදු කරන ලදි.

මෙහිදී 2024 සැප්තැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රියේ පාර්ලිමේන්තු ඡන්ද විමසීම සඳහා දින නියම කළ අවස්ථාවේ සිට පාර්ලිමේන්තු ඡන්ද විමසීම අවසන්වීම දක්වා කාලය තුළ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන සහ ව්‍යවස්ථාපිත දැනුම්දීම් මහජනතාව වෙත සන්නිවේදනය කිරීමෙහිලා පුවත්පත් මාධ්‍ය, කෙතරම් කාර්යභාරයක් සිදුකර තිබේද යන්න අධ්‍යයනය කරන ලදි.


මෙම ඡන්ද විමසීමේ දී මහජනතාව දැනුම්වත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024.09.25 සිට 2024.11.18 දින දක්වා මාධ්‍ය නිවේදන 84 ක් නිකුත් කර තිබේ. මෙම මාධ්‍ය නිවේදන ලංකාවේ ප්‍රසිද්ධ පුවත්පත් අතරින් තෝරාගත් පුවත්පත් 14ක් (දිණමිණ, ලංකාදීප, දිවයින, මව්බිම, මොනරා, අරුණ, දේශය, සිළුමිණ, The Island, Daily News, Sunday Times, Sunday Observer, Sunday Morning, Daily Mirror) ලබා දී තිබෙන ප්‍රමුඛතාව සහ ඒවා පළ වී ඇති ආකාරය විමර්ශනය කරන ලදි.

මෙහිදී නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන කොපමණ ප්‍රමාණයක් පුවත්පත්වල පළවී තිබේ ද යන්නත්, එම මාධ්‍ය නිවේදන පළ කිරීම සඳහා වෙන් කර ඇති පිටුව කුමක් ද යන්නත්, සහ අදාළ මාධ්‍ය නිවේදන නිකුත් කළ දිනයේ සිට කොපමණ කාලයක් පුවත්පත්වල එය පළ කිරීම සඳහා ගත වී තිබේ ද යන්න පරීක්ෂා කරන ලදි. මෙම සමීක්ෂණයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය යොදාගත් අතර එමගින් විශේෂිත සිදුවීම් පිළිබඳව ගැඹුරින් හා සවිස්තරාත්මකව විශ්ලේෂණය කිරීමේ හැකියාව මෙන්ම පුවත්පත් 14ක් මත පදනම්ව 2024 පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ මාධ්‍ය නිවේදන ආවරණය වී ඇති ආකාරය, මාධ්‍ය නිවේදනයට ලබා දී ඇති ප්‍රමුඛතාව, සහ ප්‍රකාශන කාලය පරීක්ෂා කිරීම පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාගත හැකිය.

මෙම ක්‍රමය භාවිතා කිරීමෙන් පුවත්පත් අතර සැසඳුම් කිරීමට හා ප්‍රවණතා හඳුනා ගැනීමට පහසු විය. ඒ හේතුවෙන්, මාධ්‍ය ආවරණයේ ගුණාත්මක භාවිතය මැනීමට, මැතිවරණ සම්බන්ධ නිවේදන මහජනතාවට සම්ප්‍රේෂණය වී ඇති ආකාරය විශ්ලේෂණය කිරීමට හා එය වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනා ලබාදීමට ද හැකියාව ලැබේ.

එසේම, යම් මාධ්‍ය නිවේදනයක් පුවත්පතේ පළ කිරීමට ගත වූ කාලය සහ පුවත්පත මාධ්‍ය නිවේදන සඳහා ලබා දී ඇති ප්‍රමුඛතාව පිළිබඳව නිරීක්ෂණය කිරීමෙන් පුවත්පත්වල මාධ්‍ය ආවරණයේ ස්ථාවරතාව සහ විශ්වාසනීයතාව මැනිය හැකි වේ. එබැවින්, සිද්ධි අධ්‍යයන ක්‍රමය භාවිතා කිරීමෙන් මෙවැනි විශේෂිත මාතෘකා පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කළ හැකි වීම සහ සවිස්තරාත්මක තොරතුරු ලබාගත හැකි වීම, මෙම පර්යේෂණය සඳහා විශේෂයෙන් ප්‍රයෝජනවත් විය.

මෙම සමීක්ෂණය මගින් ප්‍රධාන වශයෙන් හඳුනාගත් තොරතුරු කිහිපයකි. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන 84 අතරින් මෙම අධ්‍යයනය සඳහා යොදා ගත් පුවත්පත් 14 තුළ පළ වූ සහ පළ නොවූ මාධ්‍ය නිවේදන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.



ඇතැම් අවස්ථාවලදී එකම මාධ්‍ය නිවේදනය දින කිහිපයකදීම එකම පුවත්පතක පළ වූ අවස්ථා කිහිපයක්ද නිරීක්ෂණයට ලක් විය.

තවද මෙම සමීක්ෂණය තුළින් අනාවරණය වූ තවත් කරුණක් වුයේ යම් මාධ්‍ය නිවේදනයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් මාධ්‍ය වෙත නිකුත් කර දින 2ක් ඇතුළත බොහෝ පුවත්පත්වල වාර්තා කිරීමට කටයුතු කර ඇති ආකාරයත් පුවත්පත් කිහිපයක පමණක් මාධ්‍ය නිවේදන නිකුත් වූ දිනට පසු දිනම එය පුවත්පතේ පළ කිරීමට කටයුතු කර ඇති බවත් හඳුනාගත හැකි වීමයි.

පුවත්පත්වල මාධ්‍ය නිවේදන සඳහා වෙන්කර ඇති පිටුව පිළිබඳ තොරතුරු,

- **දිනමිණ** - මුල් පිටුවේ අවස්ථා දෙකකදී මාධ්‍ය නිවේදන පළවී තිබූ අතර සෙසු අවස්ථාවලදී බොහෝ විට පිටු අංක 1-7 අතර මාධ්‍ය නිවේදන පළවී තිබුණි.
- **ලංකාදීප** - මාධ්‍ය නිවේදන බහුතරයක් පිටු අංක 1-6 අතර පළ වී තිබුණි.
- **දිවයින** - පළ වූ මාධ්‍ය නිවේදන අතරින් බහුතරයක් පිටු අංක 1-2 පළ වී තිබුණි.
- **මව්බිම** - අවස්ථා 9ක දී පිටු අංක 1-2 මාධ්‍ය නිවේදන පළ වී තිබුණි.
- **අරුණ** - අවස්ථා 8ක දී පිටු අංක 1-2 පළ වී තිබුණි.
- **මොනරා** අවස්ථා 7ක දී පිටු අංක 1-2 මාධ්‍ය නිවේදන පළවී තිබුණි.
- **Daily News** - අවස්ථා 5ක දී පිටු අංක 1-2 මාධ්‍ය නිවේදන පළ වී තිබුණි.
- **The Island**, **සිළුමිණ** හා **දේශය** පිටු අංක 1-2 මාධ්‍ය නිවේදන දෙක බැගින් පළ වී තිබුණි.
- **The Sunday Times** පළවූ මාධ්‍ය නිවේදන 2 පිටු අංක 8 හා 18 පළ වී තිබුණි.

**පුවත්පත්වල වැඩි අවධානයක් ලබා දී තිබු මාධ්‍ය නිවේදන**

1. PE/2024/01 - ස්වාධීන කණ්ඩායම් විසින් ඇප මුදල් තැන්පත් කිරීම සහ ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් නාමයෝජනා කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු.
2. PE/2024/03 -. තැපෑලෙන් ඡන්දය දීමට අපේක්ෂිත ඡන්දහිමියන් වෙත කෙරෙන දැනුම්දීම්.
3. PE/2024/10 - සියලුම අපේක්ෂකයන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දීමේ අවශ්‍යතාව
4. PE/2024/14 - තැපෑලෙන් ඡන්දය ඉල්ලුම් කිරීම
5. PE/2024/17 - ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කළ යුතු තැනැත්තන්ගේ ලැයිස්තුව (ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර අපේක්ෂක ලැයිස්තුව)
6. PE/2024/21 - පිළිගත් සහ ප්‍රතික්ෂේප වූ නාමයෝජනා විස්තර
7. PE/2024/27 - 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන
8. PE/2024/40 - ඡන්දදායකයා පරීක්ෂා කිරීම හා උචිත ලකුණ සළකුණු කිරීම.
9. PE/2024/45 - තැපැල් ඡන්ද සලකුණු කිරීම හා ඒ සඳහා වලංගු හැඳුනුම්පත්.
10. PE/2024/66 - මැතිවරණ ප්‍රචාරක කටයුතු තහනම් නිහඬ කාලය

**සමීක්ෂණයේ සමස්ත නිරීක්ෂණ**

1. 2024.09.25 සිට 2024.11.18 දින දක්වා කාලය තුළ මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් භාෂාත්‍රයෙන් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන 84 අතරින් පුවත්පත්වල පළ කර තිබූ මුළු මාධ්‍ය නිවේදන සංඛ්‍යාව 36 කි. මාධ්‍ය නිවේදන 48 ක් කිසිදු පුවත්පතක පළකර නොතිබුණි.
2. පළ වූ මාධ්‍ය නිවේදන අතරින් වැඩිම මාධ්‍ය නිවේදන සංඛ්‍යාවක් දිනමිණ සහ ලංකාදීප යන පුවත්පත්වල පළකර තිබූ අතර එම සංඛ්‍යාව පිළිවෙලින් 19 සහ 18 කි.
3. Daily Mirror, Sunday Observer, Sunday Morning යන පුවත්පත්වල මැතිවරණ කොමිෂන් සභාව මඟින් නිකුත් කර ඇති කිසිඳු මාධ්‍ය නිවේදනයක් මෙම කාලය තුළ පළකර නොමැති බව නිරීක්ෂණය විය.
4. සති අන්ත පුවත්පත්වල 2024.09.25 සිට 2024.11.18 දක්වා කාලය තුළ මැතිවරණ කොමිෂන් සභාව මඟින් නිකුත් කර ඇති මාධ්‍ය නිවේදන සඳහා ලබා දී තිබූ අවධානය ඉතා අඩු බවක් දක්නට ලැබුණි.
5. මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාල මාධ්‍ය නිවේදනය නිකුත් කොට දින 2 ක කාලයක් ඇතුළත බොහෝ පුවත්පත් එය වාර්තා කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන අතර පුවත්පත් කිහිපයක් පසුදිනම එය පළ කිරීමට කටයුතු කර ඇත.
6. මාධ්‍ය නිවේදන පළ කිරීමේදී තෝරාගත් මාධ්‍ය නිවේදන කිහිපයක් සඳහා පමණක් වැඩි අවධානයක් ලබා දී තිබේ.
7. ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත්වල නිවේදන පළවීමේ අඩු ප්‍රවණතාවක් දක්නට ලැබේ.
8. සති අන්ත පුවත්පත්වල මාධ්‍ය නිවේදන පළවීමේ ඉතාමත් අඩු බවක් දක්නට ලැබේ.

ඉහත නිරීක්ෂණ අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ව්‍යවස්ථාපිත නිවේදන පළ කිරීම මගින් මහජනතාව දැනුම්වත් කිරීමේදී පුවත්පත් මාධ්‍ය සැලකිය යුතු තරමේ කාර්යභාරයක් සිදුකර නොමැති බව ස්ඵුට වේ.

මෙම තත්වය සියලු දෙනාගේ අවධානයට ලක්විය යුතු තත්වයකි. මහජනතාවට වැදගත් තොරතුරු නිවැරදිව සුදුසුම අවස්ථාවේදී ලබාදීම සඳහා පුවත්පත් මාධ්‍ය වඩාත් වගකිවයුතු ලෙස කටයුතු කළ යුතු ය. විශේෂයෙන් ජනතාව ඉතා අවධානයෙන් පසුවන මැතිවරණ සම්බන්ධ නිවේදන අවශ්‍ය අවස්ථාවල දී සුදුසුම වේලාවට ඒවා ජනතාව වෙත ළඟා විය යුතු වේ. මෙම තත්වය සැලකිල්ලට ගෙන මැතිවරණ සම්බන්ධ නිවේදන ජනතාවට කඩිනමින් සහ නිවැරදිව ළඟා කිරීමේ තීරණාත්මක පියවරක් ගත යුතු ය. එය නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහාත්, ජනතාව දැනුම්වත් කිරීම සඳහාත් සහ ජනතා තීරණ ගැනීමේ අවකාශය වඩාත් විවෘත කිරීම සඳහාත් ඉතා වැදගත් වේ.

**(මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය නිවේදන පුවත්පත්වල පළවීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය සිදු කරන ලද සමීක්ෂණයේ තොරතුරු ඇසුරෙනි.)**



2024 ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳව නිරීක්ෂණ වාර්තාව ලබා දීම සම්බන්ධව යුරෝපා සංගමය සමග පැවති නිල සාකච්ජාව



පසුගිය ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය සාර්ථකව පැවැත්වීමට අදාළ කරුණු පිළිබඳ අධ්‍යයනයක් සඳහා පිලිපීන දේශපාලන පක්ෂ නියෝජිතයින් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණ පැවති සාකච්ජාව - 2025.01.23



"දූසැරියට එරෙහි කාන්තාවෝ එකමුතුව" 2025 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව මැතිවරණ කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද ක්‍රියාකාරී කාන්තා දේශපාලඥයින් සමඟ පවත්වන ලද වැඩමුළුව - 2025.03.05



2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව පොලිස් දෙපාර්තමේන්තුව සමග පැවති සාකච්ජාව 2025.03.06



වියදම් නියාමනය සම්බන්ධව දේශිය නිරීක්ෂණ සංවිධාන සමග පැවැත් වූ වැඩමුළුව - 2025.03.06



2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව සමග පැවැත් වූ සාකච්ජාව - 2025.03.07



2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව
තැපැල් දෙපාර්තමේන්තුව සමග පැවැත් වූ සාකච්ජාව - 2025.03.07


**උපදේශක මණ්ඩලය**

ආර්.එම්.ඒ.එල්. රත්නායක - සභාපති
එම්.ඒ.පී.සී. පෙරේරා - සාමාජික
අමීර් ෆායිස් - සාමාජික
අනුසූයා ෂන්මුගනාදන් - සාමාජික
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක - සාමාජික
සමන් ශ්‍රී රත්නායක - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
රසික පීරිස් - අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)

**සංස්කරණය**

චන්න පී. ද සිල්වා
(අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රමසම්පාදන)

**පරිගණක පිටු සැකසුම**

අමිල ගමගේ (මැතිවරණ කොමිෂන් සභාව)

**මුද්‍රණය**

රජයේ මුද්‍රණාලය

**ප්‍රකාශනය**

පර්යේෂණ හා සැලසුම් ශාඛාව,
මැතිවරණ කොමිෂන් සභාව

**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**

සංස්කාරක
කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.



(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk elecomsl SriLankaElectionCommission Election Commission of Sri Lanka



මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් ප්‍රකාශ නොවේ. මෙහි ඇතුළත් කරුණු, උපුටා පළ කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.